# පිලිසඳර
# PILISANDARA

**2017**
**නොවැම්බර්/දෙසැම්බර්**
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Society of Sri Lanka


# 2018
## සුබ නව වසරකට ආසිරි



උදාවන 2018 නව වසර
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා
සංගමයේ සියලු සාමාජික භවතුන්ගේ
බලාපොරොත්තු ඉටුවන වාසනාවන්ත
සුබ ම සුබ නව වසරක් වේවා!!

2018 වසරේ ඡායාරූප ශිල්ප පංති ආරම්භය ජනවාරි 28 දින උත්සවාකාරයෙන් සිදුකරලීමට විධිවිධාන යොදා ඇත.

එදින ප.ව 1.00 ට කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී පළමු සැසිය පැවැත්වෙන අතර ආරාධිත දේශනය මහාචාර්ය සේන නානායක්කාර මහතා විසින් පැවැත්වීමට නියමිතයි.



## නව වසරේ පංති ආරම්භය

## ඉදිරි ජනවාරියේ අපේ පෙළගැස්ම

ජනවාරි
07 - නවකයින් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණ
14 - අර්ධ වාර්ෂික මහා සභාව
21 - වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය
28 - ඡායාරූප පාඨමාලා සමාරම්භක උත්සවය

## අපි හමුවෙන දවස ජනවාරි 14

**සංගමයේ අර්ධ වාර්ෂික මහා සභාව ජනවාරි 14 වැනි දින පෙරවරු 9.00 ට රාජගිරිය, සිංහ සමාජ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට සැලසුම් කොට ඇත. එදිනට ඔබගේ පැමිණීම අත්‍යවශ්‍ය ම වේ.**

**අදාළ නිල දැන්වීම හා ආරාධනය සඳහා පිළිසඳර ඇතුළු පිටු බලන්න.**

## ඇතුළු පිටු


» අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම - 2017/2018 නිල ආරාධනා පත්‍රය
» අපේ හිතවතුන් සංගමයට කැඳවමු
» පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2017
» සහෘදයන්ගේ හෝරාව මදක් ඉදිරියට
» අපට ඔබව අවශ්‍යමයි
» සංගමයේ කෙටි පණිවුඩ ඔබට එනවද
» වාර්ෂික සමාජ සත්කාරය
» 2017 සහයෝගයට ස්තූතියි
» මතක තියා ගන්න දැන් පිළිසඳර එන්නේ ඔබට විතරයි
» 2017 වසරේ AFIAP සහ EFIAP සම්මානලාභීන්
» මාසික තරග ජයග්‍රහණ
» අපේ විත්තියෙන් ඔබේ ජයග්‍රහණ
» ගොඩනැගිලි අරමුදලට අපිත් දායක වෙමු
» චක්‍රලේඛන උපුටනයෙන් ජනමාධ්‍ය පරිශීලනය හා මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීමේ උපදෙස්



**QD/81/NEWS/2018**

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# ප්‍රමුඛ පුවත්

## නිල ආරාධනා පත්‍රය

## අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම - 2017/2018

හිතවත් සාමාජික / සාමාජිකාවන් වෙත,

අප සංගමයේ 2017/2018 වර්ෂයේ අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම පහත සඳහන් දින පැවැත්වීමට තීරණය කර ඇත.


| | | |
|---|---|---|
| දිනය | : | 2018 ජනවාරි මස 14 වැනි ඉරු දින |
| වේලාව | : | පෙරවරු 09.00 ට |
| ස්ථානය | : | රාජගිරිය, සිංහ සමාජ ශ්‍රවණාගාරයේ දී |

මෙදින රැස්වීමට ඔබගේ පැමිණීම අපි ඉතා ගෞරවයෙන් යුතුව අපේක්ෂා කරමු.

*ගරු අධ්‍යක්ෂ මණ්ඩලය*

## අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම - 2017/18
## න්‍යාය පත්‍රය

- පොල් තෙල් පහන දැල්වීම
- ජාතික ගීය වාදනය කිරීම
- සභාව පිළිගැනීම - සභාපති
- අප අතරින් වියෝවී ඇති සාමාජික/ සාමාජිකාවන් සිහිකිරීම
- ලිපි කියවීම
- 2016/17 අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කිරීම - විධායක අධ්‍යක්ෂ
- එම රැස්වීම් වාර්තාව සභා සම්මත කරගැනීම
- ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීම - විධායක අධ්‍යක්ෂ
- අයවැය සමාලෝචනය ඉදිරිපත් කිරීම - මුදල් අධ්‍යක්ෂ
- මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය
- අදහස් හා යෝජනා
- ස්තුති කථාව - විධායක අධ්‍යක්ෂ





**මතකනේ..**
**ජනවාරි 14 ඉරිදාවේ.. උදේ 09 ට..**
**රාජගිරිය සිංහ සමාජ ශ්‍රවණාගාරයට..**

අර්ධ වාර්ෂික මහ සභාවේදී ඉදිරිපත් කළයුතු ඔබගේ අදහස් යෝජනා වෙතොත් ජනවාරි මස පළමු සති අන්තයට ප්‍රථම (ජන. 07) ගරු විධායක අධ්‍යක්ෂතුමා වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට කාරුණික වන්න, නොඑසේනම් ගරු විධායක අධ්‍යක්ෂ, නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ යන ලිපිනයට ඉහත දිනට පෙර ලැබීමට සලස්වන්න.

# අපේ හිතවතුන් සංගමයට කැඳවමු

**2018 වර්ෂය සඳහා ඡායාරූප ශිල්ප,
රූපවාහිනී මාධ්‍ය, සිනමාව ගැන උනන්දුවක් දක්වන
අපේ හිතවතුන් සංගමයට සම්බන්ධ කරමු.**

**දැන් ඒ සඳහා අවස්ථාව උදාවී ඇත.
විමසීමක් වෙතොත් 0718 229 204/ 0714 901 200 අමතන්න.**



**චක්‍රලේඛ උපුටනය - චක්‍රලේඛ අංක : ප්‍රකා/015/012**

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
## The National Photographic Art Society of Sri Lanka

## ජනමාධ්‍ය පරිශීලනය හා මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීමේ උපදෙස්

### අරමුණ

සංගමයේ සෑම සාමාජිකයෙකු ම තමාගේ හා සංගමයේ ගරුත්වයට හානි නොවන සේ ජනමාධ්‍ය භාවිත කිරීම පිළිබඳ උපදෙස් ලබාදීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ. මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය, අන්තර්ජාල වෙබ් අඩවි සහ මුහුණු පොත මගින් සංගමය හා සම්බන්ධ තොරතුරු ප්‍රකාශයට පත්කිරීම කෙරෙහි මෙමගින් අවධානය යොමු කෙරේ.

**01.** ප්‍රකාශන අධ්‍යක්ෂවරයාගේ වගකීම යටතේ සිදු කෙරෙන සියලු පළකිරීම්වලට තොරතුරු ලබාදීමේ සහ ඒවායේ නිර්මාණාත්මක වටිනාකම් ඉහළ නැංවීමේ කාර්යයනට දායක වීමේ අයිතිය සාමාජිකයින් සතු වේ.

**02.** සාමාජික සුබසිද්ධිය උදෙසා සාමාජිකයින් ඉලක්ක කොටගෙන පළකෙරෙන ප්‍රකාශනවල අන්තර්ගතය පිළිබඳ සියලු ම වගකීම් ප්‍රකාශන අධ්‍යක්ෂවරයා සතු ය.

**03.** පොදු මහජනතාව ඉලක්ක කොට ගෙන සංගමයේ වගකීමට යටත් ව කවර හෝ මාධ්‍යයකින් පළකෙරෙන ප්‍රකාශනවල අන්තර්ගතය ද ප්‍රකාශන අධ්‍යක්ෂවරයාගේ අනුමැතියට යටත් වන අතර ඒ සැමෙකක් ම සංගමයේ වටිනාකම් හා ප්‍රතිරූපය ඉහළ නැංවීම අරමුණු කොටගත යුතු ය.

**04.** සංගමයේ කිසියම් නිලධාරියකු හෝ සාමාජිකයෙකු ප්‍රසිද්ධ ජනමාධ්‍ය හෝ අන්තර්ජාල මාධ්‍ය සන්නිවේදන කාර්යයන් සඳහා සංගමයේ නම පාවිච්චි කරන්නේ නම් ඒ බැව් සභාපති හෝ විධායක අධ්‍යක්ෂවරයාට දන්වා අනුමැතියක් ලබාගත යුතු ය.

**05.** සංගමයේ සාමාජිකත්වය හෝ තමන් දරන නිලයට අනුව ජනමාධ්‍යවල පෙනීසිටීමට හෝ ඒ සඳහා ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවකාශ ඇති නමුදු එමගින් සංගමයට කිසිදු හෝ අගතියක් සිදු නොවන්නට වගබලාගැනීම සියලු සාමාජික භවතුන්ගේ යුතුකම හා වගකීම වේ.

**06.** කිසියම් සාමාජිකයකු තම හැඳින්වීම්පත් (Visiting card, Business card), අන්තර්ජාලය සඳහා හෝ ප්‍රචාරණ පුවරු සඳහා තම නම සමග සංගමය පිළිබඳ සඳහනක් සිදු කරන්නේ නම්,


- **6.1** සාමාජිකත්වය සහ / හෝ තමන් විසින් සංගමයෙන් ලබා ඇති සුදුසුකම් නිරවද්‍ය ලෙස සඳහන් කළ යුතු වේ.
- **6.2** සංගමයෙන් ලබා ඇති තනතුරු සඳහන් කරන්නේ නම් අදාළ නිල කාලයට සීමා වන සේ සඳහන් කළ යුතු වේ.

**07.** කවර හෝ සාමාජිකයකුට සංගමයේ වගකීම යටතේ ඒ හා සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කළ යුතු යැයි හැඟේ නම් ඒ පිළිබඳව ප්‍රකාශන අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ හෝ සභාපතිවරයා වෙතින් වාචික හෝ ලිඛිත අනුමැතියක් ලබාගත යුතු වේ.

**08.** එසේ අනුමැතියකට යටත්ව කෙරෙන පළකිරීමෙහි ඇතුළත් කරුණු සංගමයේ ප්‍රතිපත්තිවලට, ප්‍රතිරූපයට හා ගෞරවයට කිසිදු ආකාරයකින් හානිකර හෝ හානිකර අර්ථ නිරූපණයට හේතු නොවිය යුතු ය.

## අධ්‍යාපන පුවත්

### පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2017





ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් පාසල් දරුවන් සඳහා වාර්ෂිකව පවත්වන ඡායාරූප ශිල්ප පරීක්ෂණය පසුගිය දෙසැම්බර් මස 09 වැනි සෙනසුරාදා කොළඹ නාලන්දා විද්‍යාලයේ දී පැවැත්විණි. ඒ සඳහා ලියාපදිංචි අපේක්ෂකයින් 74 දෙනෙකුගෙන් එදින විභාගය සඳහා 65 දෙනෙක් පෙනී සිටියහ. ඒ සඳහා ලංකාවේ ප්‍රධාන පෙළේ පාසල් වන කොළඹ නාලන්දා විද්‍යාලය, ගෝතමී බාලිකාවිද්‍යාලය, කොළඹ විශාකා බාලිකා විද්‍යාලය, මිනුවන්ගොඩ ජනාධිපති විද්‍යාලය, ගාල්ල මහින්ද විද්‍යාලය, රාජගිරිය ජනාධිපති බාලිකා විද්‍යාලය, ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලය, ගම්පහ රත්නාවලී බාලිකා, ගම්පහ යශෝධරා බාලිකා විද්‍යාලය යන පාසල්වල සිසුසිසුවියන් සම්බන්ධ විය.

මෙම කර්තව්‍ය සඳහා නාලන්දා විද්‍යාලයීය පරිශ්‍රය ලබාදුන්, ගුරු විදුහල්පති තිලක් වත්තුහේවා මහතා සහ ඡායාරූප ශිල්පය භාර ආචාර්නී නිර්මලා චාන්දනී මහත්මිය ස්තූති පූර්වකව සිහිකරමු.



iyDohkaf.a fydaadj

### මදක් ඉදිරියට..

ගරු සමාජ සේවා හා සුබ සාධක අධ්‍යක්ෂ වජිර වික්‍රම මහතාගේ ඉල්ලීම පරිදි 2018 වසරේ නව සාමාජිකයින් ද සමග සාමාජික සුහද හමුව පැවැත්වීමට අපේක්ෂා කරන බැවින් ඉදිරි පිළිසඳර කලාපයන් මගින් ඔබව දැනුවත් කෙරෙනු ඇත.

## අපේ විත්ති

# මහාචාර්ය පල්ලියගුරුට ප්‍රණාම හරසර





**ගම්පහ දිස්ත්‍රික්කයේ ලේඛක සංගමයේ 2017 වාර්ෂික සාහිත්‍ය සම්මාන උළෙල පසුගිය ඔක්තෝම්බර් 28 වන දින ගම්පහ දිස්ත්‍රික් ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ හා ප්‍රවීණ ලේඛකයන් ඇගයීමේ දෙවන පියවර ලෙස එදින අප සංගමයේ ගරු සාමාජික මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා සාහිත්‍ය ප්‍රණාම තිළිණයෙන් පිදුම් ලැබීය.**

**එමෙන්ම, පසුගිය නොවැම්බර් මස 22 වන දින පැවැති කැළණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යනාංශයේ වාර්ෂික සංජනනී මාධ්‍ය උළෙලේ දී හරසර සම්මානයෙන් පිදුම් ලැබීමට ද අප සංගමයේ ගරු සාමාජික මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා සමත් වූයේය.**

# විශාරද නන්දා මාලනියට සම්මාන ආචාර්ය උපාධියක්



අප සංගමයේ ගෞරව සාමාජිකා හෙළයේ ආදරණීය ගායිකාව වූ විශාරද නන්දා මාලනිය සිංහල සංගීතයට හා ගීතයට ඉටුකළ මහඟු මෙහෙවර සලකා බලා දෘශ්‍ය කලා හා සෞන්දර්ය විශ්ව විද්‍යාලය මඟින් සම්මාන ආචාර්ය උපාධියක් පිරිනැමීමට කටයුතු කළහ.

## තිලක්ට, මහින්දට සුවඳ පත්ම උපහාර



අප සංගමයේ ගෞරව සාමාජිකයකු මෙන්ම විශිෂ්ඨ රංගධරයෙක්, වේදිකා නාට්‍ය, සිනමා හා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරයෙක්, ලේඛකයෙක් හා ක්ෂේත්‍රයට අදාල දැනුම බෙදා දෙන දේශකයෙක් ලෙස හෙළ කලා කෙත පෝෂණය සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කරන්නා වූ කලාසූරි සතිශ්චන්ද්‍ර එදිරිසිංහයන්ගේ සභාපතිත්වයෙන් යුත් මිහිඳු සංස්කෘතික පදනම හය වන වරටත් පවත්වනු ලබන සුවඳ පද්ම උපහාර සම්මාන උළෙල ඔක්තෝම්බර් මස 29 වන දින කොළඹ, බිෂොප් විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

දේශීය කලා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය පතා ඉටුකරන ලද සේවාව සාමාජික හවතුන් වන තිලක් ගොඩමාන්න සහ එම්. ඩී. මහීපාල යන මහත්වරුන් මෙහි දී සුවඳ පද්ම උපහාර සම්මානවලින් පිදුම් ලැබූහ.

# දී. ග. ට - හෙට්ටි ට
## කැලණි සරසවියෙන් උපහාර





කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය මඟින් පසුගිය ඔක්තෝම්බර් මස 26 වැනි දින විශ්ව විද්‍යාල කලාගාරයේ දී විවෘත කෙරුණු ආලම්බන ඡායාරූප ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයේ දී අප සංගමයේ ගරු සාමාජිකයන් දෙපළක් වන දි. ග. සෝමපාල සහ පී. හෙට්ටිආරච්චි යන කීර්තිධර ඡායාරූප කලාවේදීන් විශේෂ උපහාරයකින් පුදනු ලැබීය.

# ආලම්බන පළමු තැන අමානිට





කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන හා මහජන සම්බන්ධතා යන විෂයන් හදාරන ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිසුන්ගේ නිර්මාණ ඇතුළත් ආලම්බන ඡායාරූප ප්‍රදර්ශනයේ ප්‍රථම ස්ථානය දිනාගැනිමට අප සංගමයේ දෙවන වසර විද්‍යාර්ථී අමානි ඉරේෂිකා රූපසිංහ මෙනවිය සමත් වූවාය.

එමෙන්ම, ගෙවුණු වසරේ දී ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ සහෘදයින් ලබාගත් ජාතික හා ජාත්‍යන්තර ඇගයීම් සම්මාන සහතික වෙනුවෙන් විශ්ව විද්‍යාල මට්ටමෙන් ඇගයීමක් කැලණිය විශ්ව විද්‍යාලය මගින් පවත්වන්නට යෙදුනු සංජනනි මාධ්‍ය උලෙළේ දී සිදුකෙරුණි. එහි දී අප සංගමයේ සාමාජිකා අමානි ඉරේෂිකා මෙනවිය ද ඇගයීමට පාත්‍රවිය.

## Grand Prize of 2017
### ලක්ෂිත කරුණාරත්නට





**ජාත්‍යන්තර සම්මානලාභී වනජීවී ඡායාරූප ශිල්පී අප සංගමයේ සාමාජික ලක්ෂිත කරුණාරත්න මහතා Nature's Best Photography, Windland Smith-Rice awards හි Grand Prize of 2017 සම්මානය හිමිකර ගැනීමට සමත් වීය.**

**සම්මානය හිමි වූයේ ඔහුගේ 'African Lionesses' නමැති ඡායාරූපයටය**

# හර්ෂ මධුරංගයන්ට තවත් ජයක්





යුරෝපයේ ප්‍රමුඛතම සහ විශාලතම මංගල ඡායාරූප තරගයක් වන ‘PWS’ තරගයේ දී අප සංගමයේ හිටපු විධායක අධ්‍යක්ෂවරයකු වන හර්ෂ මධුරංග ජයසේකර මහතා ට ‘Wedding Photo Journalism’ අංශයේ 3 වන ස්ථානය හිමි වී තිබේ. තවද එහි ජයග්‍රාහකයින් අතර සිටින එකම ආසියාතික මංගල ඡායාරූප ශිල්පියා හර්ෂ මධුරංගයන් වීම ද විශේෂත්වයකි.

# බන්දු ගුණරත්නයන් විදෙස් තේරීම් කමිටුවක






පසුගියදා තුර්කියේ කොන්යා නගරයේ දී පවත්වනු ලැබූ Konya Governorship Konya Culture &Tourism Directorate 11 වන ජාත්‍යන්තර ඡායාරූප තරගයේ ඇගයීම් කටයුතු සඳහා තේරීම් කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගීවීමට අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික බන්දු ගුණරත්න මහතාණන්ට අවස්ථාව උදාවිය. ශ්‍රී ලාංකික ශිල්පියෙකු FIAP හා PSA අනුග්‍රාහකත්වයෙන් පවත්වන ලද ජාත්‍යන්තර ඡායාරූප තරගයක විදේශයක දී ඇගයීම් කටයුතු සඳහා තේරීම් කමිටු සාමාජිකයකු ලෙස සහභාගීවූ ප්‍රථම අවස්ථාව ලෙස ශ්‍රී ලාංකේය ඡායාරූප ඉතිහාසයට එක්වනු ඇත.

තරග සංවිධායකවරුන් ලෙස Sille Sanat Sarayi ඡායාරූප කලාගාරය වෙනුවෙන් එම ආයතනයේ ආරාධනය පිට බන්දු ගුණරත්නයන් සමඟ Abdussettar Yarar, Ahmet Sel, Erol Doganer සහ Reha Bilir යන මහත්වරු ජූරියේ සභිකයින් ලෙස පෙනී සිටියහ.

# නවීන් දම්සරට යෞවන සම්මාන





ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය, ජාතික තරුණ සේවා සභාව එක්ව සංවිධානය කරනු ලැබූ "ජාතික යෞවන සම්මාන උළෙල - 2017" පැවැති ඡායාරූප තරගාවලියේ ඒක වර්ණ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට අප සංගමයේ පළමු වසර විද්‍යාර්ථී නවීන් දම්සර පෙරේරා සමත් විය. ඔහු පසුගිය 2016 වසරේ යෞවන සම්මාන ඡායාරූප තරගාවලියේ දී ද ඒක වර්ණ සහ වර්ණ යන දෙඅංශයෙන් ම ජයග්‍රහණ ලැබීමට සමත් වී ඇත.

# රන්දිය සේයා ජය ගත් අපේ සහෘදයින්



ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට වසර 150 ක් පිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සංවිධානය කරන්නට යෙදුණු රන්දිය සේයා - 2017 ඡායාරූප තරගාවලියේ පැවැති අංශ ද්විත්වයෙන්ම ප්‍රථම ස්ථාන අප සාමාජිකයින් හිමිකර ගැනීමට සමත් වී ඇති බව සතුටින් යුතුව දැනුම් දෙමු.

එහිදී "Tea Drinking Culture" යන අංශයෙන් ප්‍රථම ස්ථානය නිශාන්ත මල්ලවාරච්චි සහ "Tea Manufacturing Culture" යන අංශයෙන් ප්‍රථම ස්ථානය ජයනාත් ඉලන්ගකෝන් ලබා ගැනීමට සමත් වී ඇත. ජයග්‍රහණ ලැබූ සියලුම සහෘදයින්ට අපගේ සුභාශිංෂනය.

# බර්ටි ගුණසේකරයන් කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලබයි





පසුගිය දෙසැම්බර් මස 12 වන දින, කොළඹ නෙළුම් පොකුණ රංගශාලාවේ දී පැවැති 2017 රාජ්‍ය කලාභූෂණ සම්මාන උළෙලේ දී අප ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රවීණ ඡායාරූප කලාවේදී බර්ටි ගුණසේකර මහතා කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබීමට සමත් විය.

# 2017 රාජ්‍ය ඡායාරූප උළෙලේ මතකයන්...



*රාජ්‍ය ඡායාරූප උළෙල, අපේක්ෂා, ගාලු සහෘදයෝ, නෙතදර, ආදරණීය ශ්‍රී ලංකා, කැනන් ෆොටෝ මැරතන් ඡායාරූප තරගයන් ඇතුළුව පසුගිය වසර පුරා පැවැති ඡායාරූප තරගයන් ගෙන් ජයග්‍රහණ හිමිකර ගත් අප සාමාජිකයින් හට සුභාශිංශනය පිරිනමන අතර ම ඉදිරි වසර ද ජයග්‍රහණ හිමිකර ගැනීමටත් නව නවත් නව නිර්මාණ බිහිකිරීමටත් ඔබට හැකියාව ලැබේවායි පිළිසඳර අප එක සිතින් ප්‍රාර්ථනා කරමු..*

# සුරේෂ්ට ප්‍රතිභා ප්‍රණාම 2017




සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරනු ලැබූ 'ප්‍රතිභා ප්‍රණාම 2017' සාහිත්‍ය කලා මහෝත්සවයේ දී අංශ කිහිපයක් යටතේ කලාකරුවන් දස දෙනෙක් අගයා සම්මාන ප්‍රදානය සිදුකරනු ලැබූ අතර ඡායාරූප කලාවට දක්වන කැපවීම වෙනුවෙන් අප ක්‍රියාකාරී සාමාජික සුරේෂ් එස්. වීරසිංහ සම්මානයෙන් පිදුම් ලැබීය.

**ඔබේ තොරතුරුත් අපේ විත්තියට කියන්න - 0716 450 871/ kmanujith@gmail.com**

# අපගේ ශෝකය

- ජ්‍යෙෂ්ඨ සාමාජික හිටපු අධ්‍යක්ෂ ප්‍රියන්ත අබේසුන්දර මහතාගේ දයාබර නැන්දනිය වූ ද ෂර්මිලා විජේකෝන් මහත්මියගේ දයාබර මෑණියන්ගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.
- ජ්‍යෙෂ්ඨ සාමාජික වෛද්‍ය මංගලනාත් උඩුකල මහතාගේ දයාබර පියාණන් මෙන්ම ජ්‍යෙෂ්ඨ සාමාජික විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය නලින්ද සමරකෝන් මහතාගේ මාමණ්ඩියගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.
- සාමාජිකා දේවිකා ගුණතිලක මියගේ දයාබර පියාණන්ගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.

# සංවර්ධන පුවත්



# ගොඩනැගිලි අරමුදලට අපිත් දායක වෙමු..

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම තුනට යටත් ව රු. 12000/= ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු.

මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමිය වෙත මුදලින් ලබා දිය හැකි ය.



## ගෙවීමේ ක්‍රම විධි

**01. එකවර රු. 12000 ක මුදල පරිත්‍යාග කිරීම.**

**02. 2017 දෙසැම්බර් 31 දිනට පෙර රු. 6000 ක මුදලක් සහ 2018 දෙසැම්බර් 31 ට පෙර ඉතිරි රු. 6000 ක මුදල පරිත්‍යාග කිරීම.**

**03. මසකට රු. 1000 බැගින් මාස 12 ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම.**

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු. 12000 ක මුදල් ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශීර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ. මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශිර්වාද කරන බාහිර පරිත්‍යාගශීලී හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සාමාජිකයකු නොවූවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

**අපේ මහගෙදර..**
**අපිම තනමු..**

# සමාජ සේවා පුවත්

## වාර්ෂික සමාජ සත්කාරය නාවක්කුලිය - යාපනය

මෙවර වැඩසටහන මගින්, ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිය උපන් බිම් අතහැර ගොස් සිට නැවත පැමිණ පදිංචිව, හෙට දිනයේ දී යහපත් අනාගතයක් දකින්නට වෙර දරන නාවක්කුලිය ප්‍රදේශයේ ජනතාවගේ දූ-පුතුන් වෙත පොත්පත් හා පාසල් උපකරණ පිරිනැමීමට කටයුතු යොදා ඇත.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ පරිත්‍යාග (අභ්‍යාස පොත්, පාසල් උපකරණ, මුදල් ආධාර) 2018 ජනවාරි මස 15 දිනට පෙර සංවිධායක කමිටුව වෙත හෝ පහත සඳහන් ස්ථානයන්ට භාර දෙන්න.

01. නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ
011-2670190
02. නාරද ස්ටූඩියෝ - කොහුවල - 0770 335 426

නැතහොත්, ලංකා බැංකුව - බම්බලපිටිය ශාඛාවේ අංක - 717752 දරණ සංගමයේ ගිණුමට ද ආධාර මුදල් බැර කර ඔබගේ නම සහ බැරකළ මුදල 0775317608 අංකයට දැනුම් දෙන්න. මෙවැනි කටයුතු සඳහා ලැදි ඔබගේ හිතවතුන්ගේ හා ව්‍යාපාරික ආයතනයන්ගේ අනුග්‍රහය ද ලබා ගත හැකි නම් මැනවි.



නාවක්කුලිය ජනතාව සහ ඉදිවෙමින් පවතින නිවාස..

වජිර වික්‍රමගේ
අධ්‍යක්ෂ - සමාජ සේවා හා සුභ සාධක (077-5317608)

නෙරංජන් වික්‍රමආරච්චි (සංවිධායක)
(077-7187284)

ශ්‍යාමලී කරුණාපාල
(077-3841043)

ඩිල්ෂාන් නයනජිත්
(077-2428241)

විෂානි අතුකෝරල
(077-7822742)

# අපට ඔබව අවශ්‍යමයි..!!

**ඉතින් හැකි ඉක්මණින්.. ඉරුදිනක මහබෝධියට ඇවිත්..**
**සාමාජිකත්වය යාවත්කාලීන කරගන්නට..**

*මේ වන විට සාමාජික මුදල් ගෙවා නැති සාමාජික භවතුන්*
*ව්‍යවස්ථාව ප්‍රකාරව නාම ලේඛනයෙන් ඉවත්කිරීමට තීරණය කර ඇත.*
*ඒ අනුව පහත අංක සඳහන් සාමාජික භවතුන්ගේ සාමාජික හිමිකම් අහෝසි කිරීමට නියමිත ය.*
*ඔබේ සාමාජික අංකය ද පහත ලේඛනයේ ඇතුළත්ව ඇත්නම් වහා ම*
*සියලු හිඟ සාමාජික මුදල් ගෙවා සාමාජිකත්වය රැකගන්න.*
*ඒ සඳහා ගරු මුදල් අධ්‍යක්ෂ කීර්ති නිශ්ශංක මහතා 0777 79 66 17 අමතන්න.*
*එය එසේ නොවන්නේ නම් 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් ඔබගේ සාමාජිකත්වය අවසන් වන බව කරුණාවෙන් සලකන්න.*

| | | |
|---|---|---|
| 1357 | Mr. | JG Premesiri |
| 2155 | Mr. | AK Nanayakkara |
| 2420 | Mr. | Mervin Senanayeka |
| 2657 | Mr. | LD Gunawardana |
| 2938 | Mr. | WDS Fernando |
| 3146 | Mr. | LG Jayasooria |
| 3189 | Mr. | PLJP Gunasekara |
| 3230 | Mr. | PR Premakumara |
| 3496 | Mr. | PaM Prasanna |
| 3763 | Mr. | AMSS Bandara |
| 4426 | Mr. | KSN Alwis |
| 4490 | Mr. | HNJC Silva |
| 4586 | Mr. | AWADN Abeysekara |
| 4674 | Mr. | RJ Priyantha |
| 4799 | Mr. | RA Lianaarachchi |
| 4882 | Mr. | WM Iroshana |
| 4912 | Mr. | SS Gamage |
| 5101 | Mr. | MAAT Geetharanga |
| 5387 | Mr. | PC Mudunkotwa |
| 5510 | Mr. | MAH Niroshana Perera |
| 5518 | Mr. | ND Gunawardana |
| 5656 | Mr. | VT Agasthi |
| 5723 | Mr. | GLS Premerchandra |
| 5725 | Mr. | GGL Galagoda |
| 5809 | Mr. | KNN Sanjeewa |
| 5814 | Mr. | MW Menaka Sanjeewa |
| 5815 | Dr. | RW Pallegama |
| 5830 | Mr. | DMNSB Disanayake |
| 5833 | Miss. | NSAHH Senevirathna |
| 5849 | Mr. | MF Jamaldeen |
| 5857 | Mr. | RMB Rathnayeka |
| 5858 | Mr. | WVA Ekanayake |
| 5879 | Mr. | AHMTHB Herath |
| 5981 | Mr. | BRLP Gunathilaka |
| 6051 | Miss. | BP Samarasinghe |
| 6053 | Mr. | OLJDA Perera |
| 6054 | Miss. | TVSN Buddhipriya |
| 6078 | Mr. | BYC Perera |
| 6088 | Mr. | KJ Daniel |
| 6096 | Miss. | KVC Karunarathna |
| 6099 | Mrs. | SSV De Silva |
| 6109 | Mr. | WAKP Silva |
| 6117 | Mr. | DRS Podduwage |
| 6118 | Mr. | MGT Nayanapriya |
| 6144 | Mr. | KM Kumburegedara |
| 6152 | Mr. | MADTL Gunathilaka |
| 6160 | Mr. | YMI Silva |
| 6172 | Mr. | KAL Priyankara |
| 6173 | Mr. | AWC Sampath |
| 6184 | Mr. | HML Neomal |
| 6185 | Mr. | MASN Palihawadana |
| 6187 | Mr. | SOMMN Samarasekara |
| 6204 | Miss. | Chithrananda SH Suvini |
| 6206 | Mr. | SWKBRK Siriwardana |
| 6209 | Mr. | HD Krishantha |
| 6211 | Mr. | MDS Lakshan |
| 6216 | Mr. | GGOAK DE Silva |
| 6239 | Mr. | D Samarasinghe |
| 6240 | Mr. | N Manivanan |
| 6241 | Mr. | PYSP Perera |
| 6242 | Mr. | TSA Fernando |
| 6245 | Mr. | PGMS Jayasinghe |
| 6249 | Mr. | RGO Rybasinghe |
| 6250 | Miss. | HASL Hettiarachchi |
| 6251 | Mr. | SMS Fernando |
| 6254 | Miss. | PKWM Nonis |
| 6255 | Mr. | MGDR Ariyawansha |
| 6256 | Mr. | HSMP Piyathissa |
| 6257 | Mr. | HLJ Dharmamakeerthi |
| 6260 | Mr. | HACD Gunasekara |
| 6262 | Mr. | WHMNC Wijekoon |
| 6263 | Mr. | IHDN Jayarathne |
| 6265 | Mr. | SPJG Premerathna |
| 6266 | Mr. | WAKG Somathilaka |
| 6267 | Mr. | WASS Kawshalya |
| 6268 | Mr. | PVS Hevavasam |
| 6269 | Mr. | SHAP Wijerathne |
| 6272 | Mr. | BCM Jayawardana |
| 6274 | Mr. | BDP Lakmal |
| 6275 | Miss. | ESP Kumarage |
| 6276 | Mr. | PTM Godakumbura |
| 6277 | Mr. | DGS Disanayeka |
| 6278 | Mr. | ARS Pavithra |
| 6279 | Miss. | YGOK Dinushika |
| 6280 | Miss. | IMAM Kumari |
| 6285 | Mr. | MPP Liyanage |
| 6287 | Mr. | GDM Prasad |
| 6288 | Mr. | MCHP Fernando |
| 6293 | Mr. | HDKR Bandurathne |
| 6294 | Mr. | OVAP Dananjaya |
| 6296 | Mr. | CH Gurusinghe |
| 6298 | Miss. | KGM Munasinghe |
| 6299 | Miss. | DMRK Dissanayake |
| 6300 | Miss. | EWL Rathnasiri |
| 6301 | Miss. | HKA Erangi |
| 6302 | Mr. | KWP Hasanka |
| 6303 | Miss. | WMANK Wasala |
| 6304 | Miss. | TKT Rukmali |
| 6305 | Mr. | WS De Silva |
| 6306 | Mr. | DKS Nipuna |
| 6307 | Mr. | NACR Nishshanka |
| 6309 | Mr. | DACL Gunawardana |
| 6310 | Mr. | HMAS Herath |
| 6311 | Miss. | TIP Piyasena |
| 6312 | Mr. | MMK Padmalal |
| 6313 | Mr. | AGWG Kumara |
| 6314 | Mr. | WANM Ranaweera |
| 6315 | Miss. | SB Ranasinghe |
| 6316 | Miss. | BAM Dilrukshi |
| 6317 | Miss. | AS Priyabhashini |
| 6318 | Mr. | WP Kanishka Dananji |
| 6319 | Mr. | JP Karunanayeke |
| 6320 | Mr. | PSI Abeykoon |
| 6321 | Mr. | LP Gamagedera |
| 6322 | Mr. | SD Wickckramasuriya |
| 6323 | Mr. | JHGK Chathuhranga |
| 6324 | Mrs. | MRR Senadheera |
| 6325 | Mr. | MNS Kumara |
| 6326 | Mr. | DW Priyadarshana |
| 6329 | Mr. | MJ Lakshitha |
| 6330 | Mr. | SH Daladawaththa |
| 6332 | Mr. | DMAGIS Darmarathne |
| 6336 | Mr. | NDGA Perera |
| 6337 | Mr. | KLDNC Amarawansa |
| 6338 | Mr. | IJ Samantha |
| 6343 | Mr. | PBC Kulathunga |
| 6344 | Mr. | HRAS Wickramanayake |
| 6345 | Mr. | WMKMMA Fernandu |
| 6346 | Mr. | NB Weerawansa |
| 6347 | Mr. | JL De Soysa |
| 6350 | Mr. | PK Duresh Sanjaya |
| 6351 | Mr. | GRN Wijayarathna |
| 6354 | Mr. | IBDJT Weerawardana |
| 6355 | Miss. | MDDW Rodrigo |
| 6357 | Mr. | RT Chaninda |
| 6358 | Mr. | SHM Jayasinghe |
| 6364 | Miss. | LM Kalubovila |
| 6370 | Mr. | UKC Weerarathne |
| 6371 | Miss. | BASN Somasekara |
| 6373 | Mr. | WPC Pathirana |
| 6376 | Mr. | DUG Bandaragoda |
| 6379 | Mr. | AKCT Bandara |
| 6380 | Miss. | RDCP Karunarathne |
| 6381 | Mr. | Premalal |
| 6384 | Mr. | KKSP Kalahewatta |
| 6385 | Mr. | CSK Chandrasekara |
| 6386 | Miss. | AWS Lakshini |
| 6387 | Mr. | HCSB Silva |
| 6388 | Miss. | HCR Thuyakontha |
| 6389 | Mr. | HASS Vimukthi |
| 6390 | Mr. | LAPH Rupasinghe |
| 6392 | Mr. | LDCSG Abeyrathne |
| 6395 | Miss. | MWW Anuradhi |
| 6396 | Mr. | YK Senevirathne |
| 6400 | Mr. | WADRK Wijesooriya |
| 6402 | Mr. | VY Attalage |
| 6405 | Mr. | EAP Madushanka |
| 6407 | Mr. | AADY Amarathunga |
| 6411 | Mr. | PD Vithanage |
| 6412 | Mr. | RMPSW Rathnayake |
| 6413 | Miss. | WUWR Dissanayeke |
| 6414 | Mr. | AHNGWB Abesinghe |
| 6417 | Mr. | RGID Bandara |
| 6418 | Miss. | DMJC Disanayeke |
| 6419 | Miss. | NGNP Niyandagala |
| 6420 | Mrs. | PGDSMA Senevirathna |
| 6422 | Mr. | PC Pushpakumara |
| 6425 | Mr. | MA Rahaman |
| 6427 | Mr. | KRDDW Rathnaweera |
| 6428 | Mr. | JPAS Piyadasa |
| 6429 | Miss. | PW Deepika |
| 6430 | Miss. | PLS Tharanga |
| 6433 | Mr. | ADC Dhashana |
| 6434 | Mr. | JAMR Saram |
| 6435 | Mr. | NkG Gunarathna |
| 6436 | Miss. | DU Lanarol |
| 6437 | Mr. | KDHD Deshpriya |
| 6438 | Mr. | HRHMK Nadeniya |
| 6439 | Miss. | PWS Palihawadana |
| 6441 | Mr. | GSKSB Fernando |
| 6442 | Mr. | MGL Jayalal |
| 6443 | Mr. | PM Thushanga |
| 6445 | Mr. | DPM Ranasinghe |
| 6450 | Mr. | LM Sugathadasa |
| 6452 | Mr. | DPC Wanasinghe |
| 6453 | Mr. | BVP Karunarathne |

# ජයග්‍රහණ

## මාසික තරග ජයග්‍රහණ - (2017 නොවැ. 05) මීගමු වෙරළ වැඩමුළුව



**■ ඒක වර්ණ**

01. කසුන් රණමුක
02. ගිහාන් දූල්වල
03. ඉෂානි නාරහේන්පිට
04. සමීර ඩී. කොතලාවල
05. කසුන් රණමුක

*වෛද්‍ය එම්. එස්. වීරකෝන් ශූරතාව*
*කසුන් රණමුක*



**■ වර්ණ**

01. සමීර ඩී. කොතලාවල
02. කසුන් රණමුක
03. ධනංජය චතුරංග
04. සමීර ඩී. කොතලාවල
05. කසුන් රණමුක

*ඡායාරූප තේරීම් කමිටුව :*
*ආචාර්ය උදිත ගුණසේකර මහතා*
*ප්‍රියන්ත අමරසිංහ මහතා*
*ඉඳුනිල් මුණසිංහ මහතා*

*මාසික තරග සංවිධායක කමිටුව - මධුරංග අබේවර්ධන (0773 549 449)*
*ශෙහාන් ප්‍රනාන්දු | මනිල්ක ජයසිංහ | හේමමාලි අල්විස්*

# ප්‍රකාශන පුවත්

## ඔබේ තොරතුරුත් පිළිසඳරට ලියන්න

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට. ඔබේ තොරතුරුත් පිළිසඳරට යොමුකරන්න.

ගරු. ප්‍රකාශන අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,
නො. 170, කොලොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.
Email: kmanujith@gmail.com | T.P: 0716 450 871 / 0766 450 693



## කැලණියට 10 වසරයි

ලාංකීය ඡායාරූප කලාවේ ප්‍රදේශීය ව්‍යාප්තියට ප්‍රායෝගිකව දායක වන අප සහෝදර සංගමයක් වන කැලණි ඡායාරූප කලා සංගමය මේ වසරයේ දී ඔවුන්ගේ 10 වන වසර සංවත්සරය සමරනු ලබයි. ඔවුනට අප සංගමයේ උණුසුම් සුබ පැතුම්.

## සංගමයේ කෙටි පණිවුඩ ඔබට එනවද?

*සංගමයේ නිල නිවේදන සහෘද සාමාජික භවතුන් හට ලබාදීම අරමුණුකොට පවත්වාගෙන යන කෙටි පණිවුඩ සේවාව* (sms alert) *සමඟ ඔබ සක්‍රීය වී නොමැති නම් නොපමාව ප්‍රකාශන අධ්‍යක්ෂ මනුජිත් කටුගම්පොළ මහතා (0716 450 871) අමතා ඒ බව දැනුම් දෙන්න.*

*එමගින් සංගමයේ නිල කටයුතු පිළිබදව ඔබට ඉක්මනින් දැනුවත් වීමේ අවස්ථාව උදාවනු ඇත.*

## 2017 සහයෝගයට ස්තූතියි

**2017 වසර තුළ අප සංගමය මගින් දියත් කළ ව්‍යාපෘති ගොන්නට අතහිත දුන් අනුග්‍රාහක භවතුන්ට අපගේ ප්‍රණාමය පුද කර සිටිමු.**

A Pictures The Photo Shop | Canon metropolitan | CameraLK | seyacolor shades of paradise | Lakseya Digital Colour Lab (Pvt) Ltd | Nikon Photo Technica | MG Printers (Pvt) Ltd

## 2017 වසරේ AFIAP සහ EFIAP සම්මානලාභීන්

මෙම වසර තුළ ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය මගින් පිරිනමන AFIAP සහ EFIAP සම්මාන සඳහා සුදුසුකම් සපුරා එම සම්මාන හිමිකර ගැනීමට සමත් වූ අප සංගමයේ සාමාජිකයින් හට අපගේ සුබ පැතුම්.

*AFIAP සම්මාන ලාභීන්*
» ෂෙහාන් ට්‍රෙක්
» අශේන් මාරසිංහ
» කසුන් රණමුක
» ලක්ෂිත කරුණාරත්න
» නිශාන්ත මංජුල
» සුධාරක මොල්ලිගොඩ

*EFIAP සම්මාන ලාභීන්*
» විමල් අමරතුංග
» යමුණි රශ්මිකා
» රවීන්ද්‍ර රණසිංහ

## මතක තියා ගන්න දැන් පිළිසඳර එන්නේ ඔබට විතරයි!!

*මුද්‍රිත පිළිසඳර නිකුත් කරනුයේ සංගමයේ ගරු හා යාවජීව සාමාජිකයින් පිරිස හැරුණුකොට පෙර පිළිසඳර කලාපයන්හි දැන්වූ පරිදි මුද්‍රිත පිළිසඳර අවශ්‍යය බව දැන්වූ සාමාජික භවතුන් හට පමණි.*
*එබැවින් මුද්‍රිත පිළිසඳර අවශ්‍යයැයි දැන්වීමට තවමත් නොහැකි වී ඇත්නම් දැන්ම ප්‍රකාශන අධ්‍යක්ෂ (0716 450 871) අමතා මුද්‍රිත කලාපය අවශ්‍ය බව සඳහන් කරන්න. එසේ දැන්වීමෙන් පසු පමණක් නව වසරේ සිට සුපුරුදු මුද්‍රිත පිළිසඳර කලාපයන් ඔබ අතට පත්වනු ඇත*

## පිළිසඳරට වෙහෙස මහන්සිය

**ප්‍රකාශන අධ්‍යක්ෂ - මනුජිත් කටුගම්පොළ**
**ආවරණ අධ්‍යක්ෂ, ප්‍රකාශන - ලහිරු ජයසිංහ**

**පිළිසඳර ප්‍රකාශන අනුකමිටුව**

1 වසර: රශේන්ද්‍ර ඩිල්ෂාන්/ක්‍රිෂාන් ගීතික/නදීර ඩිල්ෂාන්/ ඉඳුවර උවන්ප්‍රිය/ තිලානි ශානිකා/අර්ජුන සුමින්ද/ ගීතිකා නිසංසලා/අසංග මුණසිංහ
2 වසර: මධුෂිකා ලක්මාලි/දිනෙත් ප්‍රනාන්දු/චමින්ද වීරසිංහ/ ගිහාන් දූල්වල/මින්දුරි අබේසේකර/අයේශා ලියනගේ
3 වසර: ආර්. එම්. මඩවල/මදුෂිකා ලක්මාලි/පියෝරි නිරන්ජන්